ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022/01/20

පෙත්සම්කරු : ඩී. ඒ. එස්. කරුණාරත්න මයා,
215/2 ඒ. බණ්ඩාරනායක මාවත,
මොරටුව.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

02. සභාපති,
සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

03. සභාපති,
අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය,
රාජකීය විද්‍යාලය,
කොළඹ 07.

04. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : එච්ආර්සී/247/18**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

පෙත්සම්කරු ඔහුගේ යූ. ඒ. කරුණාරත්න යන දරුවා වගඋත්තරකාර කොළඹ රාජකීය විද්‍යාලයට ආදි ශිෂ්‍ය පදනම යටතේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் 011 2505451 ෆැක්ස් ඊමේල්

අයදුම්පත් ඉදිරිපත් කල බව කියා සිටී. ඒ අනුව 2017-08-24 වන දින අදාල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පෙනී සිටි බවත්, එහිදී පෙත්සම්කරුගේ අයදුම්පත්‍රය සහ අතිකුත් ලේඛණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඔහුට ලකුණු 56.5ක් ලබා දුන් බව සඳහන් කර ඇත.

පෙත්සම්කරු තවදුරටත් කියා සිටින්නේ ඔහු විසින් වගඋත්තරකාර පාසලේ ඉගෙනුම ලබමින් සිටියදී ලැබූ සමහර ජයග්‍රහණයන් වල සහතික පත්‍ර සඳහා නිසියාකාරව අවධානය යොමු නොවූ නිසා මෙම ගණය යටතේ අවශ්‍ය වූ ලකුණු මට්ටමට ලගා වීමට නොහැකි වූ බවත්, ඔහුගේ දරුවාගේ නම පොරොත්තු ලේඛණයේ ඇතුලත් කර තිබූ බවද සඳහන් කර ඇත.

ඉන් අනතුරුව පෙත්සම්කරු මෙම ගැටළුව පිලිබඳව අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කිරීමෙන් පසුව 2017-12-11 වනදින අභියාචනා මණ්ඩලය ඉදිරියේ පෙනි සිටි බවත්, එහිදී ඔහුට ලබා දී ඇත්තේ සම්මුඛ පරීක්ෂණයෙන් ලැබූ 56.5ට අමතරව එක් ලකුණක් වැඩි වී ලකුණු 57.5ක් ලබා දුන් බව සඳහන් කර සිටියි.

මෙම පෙත්සම මානව හිමිකම් කොමිෂන් සභාවේ ගොනු කරමින් පෙත්සම්කරු ඉල්ලා සිටින්නේ ඔහුගේ සියලු ලේඛණ පරීක්ෂා කර ඔහුට වගඋත්තරකාර පාසල විසින් අහිමි කරන ලද ලකුණු ලබා දී ඔහුගේ දරුවාට කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් වීමට අවස්ථාව සලසා දෙන ලෙසත්ය.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල පිලිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ එනම් 2018.04.27, 2018.07.02, 2018.08.06, 2018.08.06, 2018.09.25 සහ 2018.12.20 යන දිනයන් හී පැවැත් වූ අතර, පරීක්ෂණ මුල් අවස්ථාවලදී වගඋත්තරකාර පාසල වෙනුවෙන් පෙනි සිටි ටී. ඩී. සී. ටී. අමරතුංග මහතා පවසා සිටියේ මෙම පෙත්සම්කරු ආදි ශිෂ්‍ය ගණය යටතේ අයදුම්පත් ඉදිරිපත් කර තිබූ බැවින්, ඔහුගේ සහතික පත් සහ ලේඛණ පරීක්ෂාවේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ ලකුණු සටහන් කර ඇති ආදි ශිෂ්‍ය නියෝජිත වන්න ගුණසේකර යන අයව කැඳවා විමසීම තුලින් මෙම කාරණය වඩාත් නිරවුල් කර ගත හැකි බවත්ය. එකී ප්‍රකාරව 2018.12.20 වන දින පැවැති පරීක්ෂණයට ආදි ශිෂ්‍ය නියෝජිත වන්න ගුණසේකර යන අය පරීක්ෂණයට කැඳවා ඇති අතර, ඔහු විසින් වාචික දේශනය මෙසේ ප්‍රකාශ කර සිටියි.

" මෙම පැමිණිලිකරුගේ ලිපිගොනුව අනුව පළමු සම්මුඛ පරීක්ෂණයේදි 03 වන කොටසට ලකුණු 08ක් ලබා දී ඇති අතර, 03 වන කොටස වනුයේ විෂයට බාහිර ක්‍රියාකාරකම් සඳහා ලකුණු 08ක් උපයාගෙන ඇති අතර, නමුත් අභියාචනා සලකා බැලීමේදී 06 වන ජාතික චුප්‍ර තරගාවලිය සහ ඔස්ට්‍රේලියා ජාතික රසායනික විද්‍යා තරගයට ලකුණු ලබා දී නොතිබුණු හෙයින් එම ලකුණු 02 ලබා දීමට තිබුණු නමුත් මෙම සම්මුඛ පරීක්ෂණය හදිසි කළ නිසා එක් ලකුණක් පමණක් මුළු ලකුණු වලට එකතු වී තිබූ අතර, 03 වන කොටසට අදාල ලකුණු 08 වෙනුවට එක් ලකුණක් එකතු වීමෙන් පසු ලැබිය යුතු ලකුණු ප්‍රමාණය 09 බවට පත් වූ නමුත්, මෙම කොටසට ලකුණු 10 තෙක් වැඩි කිරීමට අවස්ථාව තිබූ නමුත්, ඒ අනුව මෙම පැමිණිලිකරුගේ මුළු ලකුණු ප්‍රමාණය 58.5 දක්වා වැඩිවිය යුතුය. මෙම වැඩිවීමට අදාල සියළු සහතික පාසලේ

පළමු වසරට ඇතුළත් වීමේ ලිපිගොනුවට අමුණා ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරුට අභියාචනාවෙන් පසුව ලකුණු 58.5දක්වා වැඩිවිය යුතුය. ඒ අනුව මෙම පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් වන ලකුණු සීමාවට එකතු වේ. එම පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනිමට මාගේ කිසිදු විරෝධතාවයක් නොමැති බවට මෙයින් දන්වා සිටිමි. "

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ :-**

ආදි ශිෂ්‍ය සංගමයේ නියෝජනයාගේ මෙම වාචික දේශණයෙන් අනතුරුව ගොනුව පිළිබඳ සලකා බැලීමේදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නියෝජිත ටි. ඩි. සි. ටි. අමරතුංග මහතාගේ සහ ආදිශිෂ්‍ය ගණය යටතේ අයදුම්පත්‍ර පරීක්ෂා කිරිමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි ආදිශිෂ්‍ය නියෝජිත වන්න ගුණසේකර මහතාගේ වාචික දේශණය ඉතා ප්‍රබල සාක්ෂියක් බවට පත් වේ. ආදිශිෂ්‍ය සංගමයේ නියෝජිත 2018.12.20 දින පැවැත් වූ පරීක්ෂණයේදී පවසා සිටින ලද්දේ පෙත්සම්කරුගේ සියලු සහතික පත්‍ර නිසියාකාරව සලකා බැලීමක් සිදු කර තිබුණේ නම්, පෙත්සම්කරුට ලකුණු ප්‍රමාණය 58.5 දක්වා වැඩිවිය යුතු බවත්ය. අදාල වසරේදී ආදිශිෂ්‍ය ගණය යටතේ ළමුන් ඇතුලත් කර ගන්නා අවම ලකුණු වූයේ 58ක් ය. පෙත්සම්කරුගේ සියලු සහතික පත්‍රවලට නිසියාකාරව ලකුණු ලබා දී තිබුණේ නම් මෙම අවම ලකුණු ප්‍රමාණය ඉක්මවා ඔහුට ද ලකුණු 58.5ක් ලබා දීමට කඩකඩ තිබූ බව පරීක්ෂණ වලින් අනාවරණය වේ.

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේදි පෙත්සම්කරුගේ දරුවා හට කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් වීමට තිබූ අවස්ථාව වගඋත්තරකාර පාර්ශවය විසින් අහිමි කර ඇති බවත්, එම දරුවා මෙම පාසලේ ඉගෙනුම ලැබීමට අවශ්‍ය සියලු සුදුසුකම් තිබෙන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

**නිගමනය :-**

මෙම සමස්ථ කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ජේදයේ 12(1) වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානත්වයෙන් සැලකීමේ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පෙත්සම්කරුගේ දරුවා වන යූ. ඒ. කරුණාරත්න යන දරුවා සමාන්තර ශ්‍රේණියට ඇතුලත් කිරිමට කටයුතු කල යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 02. 21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ඩ/-

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka